# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1995 අංක 28 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1995 නොවැම්බර් මස 28 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී**

---

1995 දෙසැම්බර් මස 01 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබා ගත හැක.

මිළ : රු. 1.50 යි. තැපැල් ගාස්තුව : රු. 2.55 යි.

# 1995 අංක 28 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1995 නොවැම්බර් මස 28 වන දින]

එල්. ඩී.-ඕ. 79/93

1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත, 1995 අංක 28 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — *ලුහුඩු නාමය.*

2. මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන, 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනතේ 2 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ " (මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික ඉතිරි කිරීමේ බැංකුව යනුවෙන් හැඳින්වෙන්නා වූ ද 6 වන වගන්තිය යටතේ තත්කාලයෙහි බැංකුවේ සාමාජිකයන් වන තැනැත්තන්ගෙන් සමන්විත වන්නා වූ ද සංස්ථාවක් " යන වචන වෙනුවට, " (මෙහි මින් මතු "බැංකුව" යනුවෙන සඳහන කරනු ලබන) ජාතික ඉතිරි කිරීමේ බැංකුව යනුවෙන් හැඳින්වෙන බැංකුවක් " යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. — *1971 අංක 30 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.*

3. පනතේ 2 වන වගන්තියට ඉක්බිතිව ම මෙහි පහත සඳහන් අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 2අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :— — *ප්‍රධාන ප්‍රඥප්තියේ අලුත් 2අ වගන්තිය ඇතුළත් කිරීම.*

"බැංකුවේ අරමුණ.

2අ. ශ්‍රී ලංකාවේ ජනතාව අතර, විශේෂයෙන් ම සීමිත මුදල් සම්පත් ඇති තැනැත්තන් අතර ඉතිරි කිරීම් ප්‍රවර්ධනය කිරීම සහ එසේ ලබාගන්නා ඉතිරි කිරීමේ ලාභදායි ලෙස ආයෝජනය කිරීම බැංකුවේ අරමුණ වන්නේ ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය මෙයින් ඉවත් කොට, ඒ වෙනුවට, මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— — *ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.*

"බැංකුවේ ප්‍රාග්ධනය.

5. (1) බැංකුවේ බලයලත් ප්‍රාග්ධනය එකක් රුපියල් දහය බැගින් වූ කොටස් එක් බිලියනයකට බෙදන ලද, රුපියල් බිලියන දහයක් වන්නේ ය.

(2) බැංකුවේ නිකුත් කළ ප්‍රාග්ධනය, අමාත්‍යවරයා විසින් මණ්ඩලය විමසා, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් කලින් කල නිශ්චය කරනු ලබන පරිදි වන්නේය. එසේ වුව ද ඒ නිකුත් කළ ප්‍රාග්ධනය, එකක් රුපියල් දහය බැගින් වූ කොටස් මිලියන එකසිය විස්සකට බෙදන ලද, රුපියල් බිලියන එකකුත් මිලියන දෙසියයකට අඩු නොවන මුදලක් විය යුතු ය.

(3) බැංකුවේ සියලු කොටස්, භාණ්ඩාගාරයේ ලේකම්වරයාගේ නිල තත්ත්වයෙන් ඔහුගේ නාමයෙන් නිකුත් කළ යුතු අතර, ඔහු විසින් ඒ කොටස් කවරාකාර වූ හෝ ආකාරයකින් බැහැර නොකළ යුතු ය.".

2—ඩී 004057—3,130 (95/12)

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙයින් ඉවත් කොට, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" බැංකුවේ බලයලත් කටයුතු සහ කර්තව්‍ය.

6. (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, මෙහි පහත සඳහන් කර්තව්‍යයන් හෝ කටයුතු සියල් ලෙහි හෝ ඉන් කිසිවක හෝ යෙදීමට බැංකුවට බලය දෙනු ලැබේ :—

(අ) ශ්‍රී ලංකාවෙහි ඉතිරි කිරීම් ප්‍රවර්ධනය කිරීම හා යෙදවීම හා තැන්පතු ගිණුම් විවෘත කිරීම, ඉතිරි කිරීමේ ගිණුම් විවෘත කිරීම, ඉතිරි කිරීමේ සහතික නිකුත් කිරීම ඇතුළුව ඊට ආනුෂංගික කටයුතු;

(ආ) ආණ්ඩුව නිකුත් කරන හෝ ආණ්ඩුව ඇප වන සුරැකුම්පත්, ණය පත්‍ර, භාණ්ඩාගාර බිල්පත් හෝ වෙනත් යම් මුදල් සාධන පත්‍ර මිලට ගැනීම සහ විකිණීම ;

(ඇ) මුදල් මණ්ඩලය විසින් කලින් කල අනුමත කරනු ලැබිය හැකි පොදු උපරිම සීමාවන්ට යටත්ව, අන්තර් බැංකු කැඳවුම් මුදල් වෙළෙඳපළෙහි මුදල් ණයට දීම ;

(ඈ) බලපත්‍රලාභී වාණිජ බැංකු සහ වෙනත් මූල්‍ය ආයතනවලින්, ඒවායේ ගනුදෙනුකරුවන්ට ණය දීම සඳහා එම වාණිජ බැංකු හා ආයතනවලට තොග වශයෙන් මුදල් ණයට දීම භාර ගැනීම ;

(ඉ) ස්වකීය ගනුදෙනුකරුවන්ගේ තැන්පතු වල ඇපය මත එම ගනුදෙනුකරුවන්ට සිල්ලර ණය දීමෙහි යෙදීම ;

(ඊ) නිශ්චල දේපළ උකස් මගින් සැපයෙන ඇප මත, නිවාස ණය සැපයීම ;

(උ) වෙනත් බැංකු හා මූල්‍ය ආයතන සමඟ ඒකාබද්ධ ණයදීම්වලට සහභාගි වීම ;

(ඌ) යම් නිශ්චල හෝ චංචල දේපළක් හෝ ඒ දේපළ පිළිබඳ යම් අයිතිවාසිකම් අත්කර ගැනීම සහ ඒ දේපළ බදු දීම, උකස් කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(එ) බැංකුව විසින් මිලට ගන්නා ලද, බද්දට ගන්නා ලද හෝ අන්‍යාකාරයකින් අත්කර ගන්නා ලද ඉඩම්වල ගොඩනැගිලි ඉදි කිරීම ;

(ඒ) ඉහත සඳහන් කර්තව්‍යයන්ට සහ කටයුතුවලට ආනුෂංගික හෝ හිතකර විය හැකි වෙනත් යම් ක්‍රියාකාරකම්වල යෙදීම.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් මුදල් සාධනපත්‍රවල බැංකුව විසින් කරන ලද ආයෝජන, මුදල් මණ්ඩලය අන්‍යාකාරව නිශ්චයක් කළහොත් මිස, බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුම්වල සහ තැන්පතු ගිණුම්වල තැන්පත් කර ඇති මුදලින් සියයට හැටකට අඩු නොවිය යුතුය. ".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

" මණ්ඩලයේ සංයුතිය.

8. (1) මණ්ඩලය අධ්‍යක්ෂවරයන් හත් දෙනකුගෙන් සමන්විත විය යුතු ය. ඔවුන් අතුරින්—

(අ) (මෙහි මින්මතු " පත්කළ අධ්‍යක්ෂවරයන් " යනුවෙන් ) සඳහන් කරනු ලබන පස්දෙනකු අමාත්‍යවරයා විසින්, බැංකුවට, එහි අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකිවන ආකාරයෙන් බැංකුවේ කටයුතු කාර්යක්ෂමව සහ සාර්ථකව මෙහෙය වීමට හැකි තැනැත්තන් ලෙස අමාත්‍යවරයා සලකන තැනැත්තන් අතුරින් පත් කරනු ලැබිය යුතු ය ;

ඒ එක් එක් තැනැත්තාට—

(i) බැංකු, වාණිජ, ව්‍යාපාරික හෝ ආශ්‍රිත ක්ෂේත්‍රයක ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ පළපුරුද්ද හෝ පරිපාලන පළපුරුද්ද හෝ තිබිය යුතු ය ; නැතහොත්

(ii) බැංකු කටයුතු, ආර්ථික විද්‍යාව, වාණිජ විද්‍යාව, නීතිය, ගණකාධිකරණය, ව්‍යාපාර කළමනාකරණය හෝ වෙනත් විෂයක වෘත්තීය සුදුසුකම් තිබිය යුතු ය; තවද

(ආ) එක් අධ්‍යක්ෂවරයකු භාණ්ඩාගාරයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයා විය යුතු ය ;

(ඇ) එක් අධ්‍යක්ෂවරයකු පෝස්ට් මාස්ටර් ජනරාල්වරයා හෝ ඔහුගේ නාමිකයා විය යුතු ය.

(2) මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් කලින් ධුරය හිස් කළ හොත් මිස, පත්කළ අධ්‍යක්ෂවරයකු අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය.

(3) යම් පත් කළ අධ්‍යක්ෂවරයකු තවදුරටත් ධුරයේ සිටීම බැංකුවේ යහපතට හානිකර බවට අමාත්‍යවරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඔහු විසින්, ඒ පත්කළ අධ්‍යක්ෂවරයා, හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) පත්කළ අධ්‍යක්ෂවරයකු විසින්, අමාත්‍යවරයා අමතා යවන ලිපියක් මගින්, සිය ධුරයෙන් කවර වූ හෝ අවස්ථාවක දී ඉල්ලා අස්විය හැකි අතර, එම ඉල්ලා අස්වීම, අමාත්‍යවරයා විසින්, ලියවිල්ලක් මගින් භාරගත් විට බලාත්මක විය යුතු ය.

(5) ඉල්ලා අස්වීමෙන් හෝ ධුර කාලය ඉකුත් වීමෙන් හෝ ධුරය හිස් කරන පත්කළ අධ්‍යක්ෂවරයෙක් නැවත පත් කිරීම සඳහා සුදුස්සෙක් වන්නේ ය.

(6) පත්කළ අධ්‍යක්ෂවරයකු ඔහුගේ ධුර කාලය ඉකුත් වීම හැර අන්‍යාකාරයකින් ධුරය හිස් කළහොත්, ඔහු වෙනුවට අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරයකු පත් කළ හැකි අතර එසේ පත් කරනු ලැබූ අධ්‍යක්ෂවරයා, ඉහත කී පරිදි ධුරය හිස් කරන අධ්‍යක්ෂවරයාගේ ධුර කාලයෙන් ඉතිරිව ඇති කාලය තුළ ධුරය දැරිය යුතු ය.

(7) පත්කළ අධ්‍යක්ෂවරයකු රෝගාතුර වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ ඔහු ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත් වන්නේ නම්, ඔහු වෙනුවට වැඩ බැලීම සඳහා අමාත්‍යවරයා විසින් සුදුසුකම් ඇති වෙනත් තැනැත්තකු පත්කරනු ලැබිය හැකිය."

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු ලෙස පත් කරනු ලැබීමට නුසුදුසුකම්.

9. යම් තැනැත්තකු—

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සාමාජිකයකු හෝ වේ නම්; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු ලෙස තීරණය කරනු ලැබ හෝ ප්‍රකාශ කරනු ලැබ සිටී නම්; හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක හෝ බලපවත්නා යම් නීතියක් යටතේ බංකොලොත්කරුවකු හෝ බුන්වත් වූවකු ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබ, නිදහස් නොලත් බංකොලොත්කරුවකු හෝ බුන්වත් වූවකු ව සිටී නම්; හෝ

(ඈ) චරිත දූෂණය ඇතුළත් වන්නා වූ ද බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කරනු ලැබිය හැක්කා වූ ද වරදකට වරදකරු කරනු ලැබ සිටී නම්,

ඒ තැනැත්තා, 8 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය යටතේ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු ලෙස පත් කරනු ලැබීමට හෝ දිගටම තනතුරු දැරීමට නුසුදුස්සෙක් වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය මෙයින් ඉවත් කොට, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"මණ්ඩලයේ සභාපතිවරයා.

11. (1) මණ්ඩලයේ එක් අධ්‍යක්ෂවරයකු අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සභාපතිවරයා ලෙස නම් කරනු ලැබිය යුතු ය.

(2) සභාපතිවරයා පැමිණ සිටින්නේ නම් ඔහු මණ්ඩලයේ රැස්වීම්වල මූලාසනය දැරිය යුතු ය. සභාපතිවරයකු පත්කර නොමැති නම් හෝ මණ්ඩලයේ රැස්වීමක් පැවැත්වීමට නියමිත වේලාවේ දී සභාපතිවරයා පැමිණ නොමැති නම් පැමිණ සිටින අධ්‍යක්ෂවරයන් විසින් තමන් අතුරින් එක් තැනැත්තකු ඒ රැස්වීමේ මූලාසනය දැරීම සඳහා තෝරාගත යුතු ය.

(3) සභාපතිවරයා තවදුරටත් ධුරයේ සිටීම බැංකුවේ යහපතට අහිතකර බවට අමාත්‍යවරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඔහු විසින් සභාපතිවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) සභාපතිවරයා විසින් අමාත්‍යවරයා අමතා යවන ලිපියක් මගින් සිය ධුරයෙන් කවර වූ හෝ අවස්ථාවක දී ඉල්ලා අස් විය හැකි ය. එම ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් භාරගනු ලැබූ විට බලාත්මක විය යුතු ය.

(5) (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ ධුර කාලය, මණ්ඩලයේ ඔහුගේ සාමාජිකත්වයේ කාලසීමාව විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය, ඒ වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(4) මේ පනතේ 26 වන වගන්තිය යටතේ පත් කරනු ලබන බැංකුවේ සාමාන්‍යාධිකාරීවරයාට සාමාන්‍යාධිකාරීවරයාගේ වැඩ කටයුතු හෝ ඔහුගේ සාමාන්‍ය ක්‍රියා කලාපය හෝ සාකච්ඡාවට භාජන යම් රැස්වීමක් හැර, මණ්ඩලයේ රැස්වීම්වලට පැමිණ සිටීමට හා එම රැස්වීම්වලට සහභාගි වීමට අයිතිවාසිකම ඇත්තේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය මෙයින් ඉවත් කොට, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" මුදල් අනුග්‍රහ ප්‍රදානය කිරීම.

17. (1) ණය දීම සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය වාණිජ උපමානවල පදනම මත, බැංකුව විසින්, මේ පනත යටතේ මුදල් අනුග්‍රහ ප්‍රදානය කළ යුතු අතර, ණය සඳහා අය කළ හැකි තත්කාලීන වෙළඳපල පොලී අනුපාතික මත, එම මුදල් අනුග්‍රහ ප්‍රදානය සඳහා ආදායමක් ලැබීමට ප්‍රයත්න දැරිය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන එසේ තිබුණ ද අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකයේ යහපත සැලකිල්ලට ගනිමින්, සහ මුදල් අනුග්‍රහය ප්‍රදානය කිරීම ආර්ථිකයේ යම් අංශයකට හෝ උප අංශයකට ආධාර කිරීම සඳහා අවශ්‍ය බව ඔහුගේ මතය වන්නා වූ අවස්ථාවක, එම මුදල් අනුග්‍රහය සඳහා වූ ඉල්ලීම හා සම්බන්ධ යම් විශේෂ අවස්ථාගත කරුණු ගැන සැලකිලිමත්ව—

(අ) මණ්ඩලයේ මතය අනුව, බැංකු කටයුතුවලට අදාළ සාමාන්‍ය ප්‍රඥගෝචර උපමානවලට අනුකූල නොවන්නා වූ, හෝ

(ආ) එවැනි අනුග්‍රහයක් සඳහා බැංකුව සාමාන්‍ය යෙන් අයකරන පොලී අනුපාතිකයට වඩා අඩු පොලී අනුපාතිකයක් මත වූ

මුදල් අනුග්‍රහයක් ප්‍රදානය කරන ලෙස මණ්ඩලය වෙත ලියවිල්ලකින් විධානයක් කළ හැකි ය.

(3) අමාත්‍යවරයා විසින්—

(අ) (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ යම් විධානයක් කරන අවස්ථාවක, එම මුදල් අනුග්‍රහය ආපසු ගෙවිය යුතු වන හෝ ඒ සඳහා පොලිය ගෙවිය යුතු වන අවස්ථාවේ දී එම මුදල් සහ පොලිය ආපසු ගෙවීම සඳහා, මණ්ඩලයට පිළිගත හැකි නියමයන් මත, අවලංගු කළ නො හැකි, කාල නිශ්චිත ඇපකරයක් එම මුදල් අනුග්‍රහය ප්‍රදානය කිරීමට පෙර ශ්‍රී ලංකා ආණ්ඩුව වෙනුවෙන් භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් සැපයිය යුතු ය ; හෝ

(ආ) (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ යම් විධානයක් කරන අවස්ථාවක, එවැනි මුදල් අනුග්‍රහයක් සඳහා අයකරනු ලබන පොලිය සහ බැංකුව විසින් සාමාන්‍ය යෙන් අයකරනු ලැබිය හැකි වූ පොලිය අතර වෙනස, භාණ්ඩාගාරයේ ලේකම් වරයා විසින් සහනාධාරයක් ලෙස බැංකු වට ගෙවිය යුතු අතර, එම සහනාධාරය භාණ්ඩාගාරයේ ලේකම්වරයා සහ මණ්ඩලය එකඟ වන පරිදි වාර්ෂිකව හෝ වෙනත් කාලසීමාවකට වරක් වශයෙන් හෝ ගෙවිය යුතු ය ; හෝ

(ඇ) (2) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද යටතේ විධානයක් කරන අවස්ථාවක, භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් මේ උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් පරිදි වූ ඇපකරයක්, එම මුදල් අනුග්‍රහය ප්‍රදානය කිරීමට පෙර සැපයිය යුතු අතර, මේ උපවගන්තියේ (ආ) ඡේද යේ සඳහන් සහනාධාරය ද ගෙවිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ ඇපකරයක් සපයනු ලැබ ඇති අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, පහසු මුල්ම අවස්ථාවේ දී, එම ඇපකරය පිළිබඳ ප්‍රකාශයක්, පාර්ලිමේන්තුව ඉදිරියේ තැබිය යුතු ය.

(5) මේ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ සපයන ලද ඇපකරයක් ඉටුකිරීම සඳහා අවශ්‍ය වන යම් මුදලක්, බැංකුව විසින් ඒ සඳහා භාණ්ඩාගාරයේ ලේකම්වරයාගෙන් ඉල්ලීමක් කරනු ලැබ, දවස් එකසිය අසූවක් ඇතුළත, ඒකාබද්ධ අරමුදලෙන් ගෙවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ අලුත් 17අ වගන්තිය ඇතුළත් කිරීම.

11. මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය 17 වන වගන්තියට ඉක්බිතිව ම මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 17අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

"අමාත්‍යවරයා වෙත තොරතුරු සැපයිය යුතු බව.

17අ. බැංකුවේ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට අවශ්‍ය විය හැකි තොරතුරු සපයන ලෙස අමාත්‍යවරයා විසින් කලින් කල මණ්ඩලයට විධාන කළ හැකි අතර, මණ්ඩලය විසින් ඒ හැම විධානයක් ම අනුව ක්‍රියා කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය මෙයින් ඉවත් කොට මෙහි පහත දැක්වෙන වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ:—

"බැංකුවේ වියදම්.

19. බැංකුවේ කර්තව්‍ය සහ ක්‍රියාකාරකම් කරගෙන යාමේ දී බැංකුව විසින් දරනු ලබන සියලු වියදම්, බැංකුවේ මුදලින් පියවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(1) බැංකුව විසින්—

(අ) පොදු සංචිතයක්; සහ

(ආ) සුදුසු යයි මණ්ඩලය අදහස් කරන කාර්ය සඳහා වෙනත් යම් විශේෂ සංචිත

පිහිටුවිය යුතු ය; තවද,

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "බැංකුවේ සංචිත සඳහා ප්‍රතිපාදන කිරීමෙන් පසුව" යන වචන වෙනුවට "බැංකුවේ සංචිතවලට මාරු කිරීමෙන් පසුව" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 21, 22 සහ 23 වන වගන්ති ඉවත් කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 21, 22 සහ 23 වන වගන්ති මෙයින් ඉවත් කරනු ලැබේ.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-- | ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

"සාමාන්‍යාධිකාරිවරයා පත් කිරීම.

20. (1) මණ්ඩලය විසින් සුදුසු හා යෝග්‍ය තැනැත්තකු බැංකුවේ සාමාන්‍යාධිකාරිවරයා ලෙස පත් කළ යුතු ය.

(2) බැංකුවේ කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය යයි මණ්ඩලය සලකන වෙනත් නිලධරයන් සහ සේවකයන් මණ්ඩලය විසින් පත් කළ හැකි ය.

(3) බැංකුවේ සාමාන්‍යාධිකාරිවරයාගේ, නිලධරයන්ගේ හා සේවකයන්ගේ වැටුප්, දීමනා හා වෙනත් ප්‍රතිලාභ ද ඔවුන්ගේ සේවා කොන්දේසි ද මණ්ඩලය විසින් නිශ්චය කළ යුතු ය.".

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය මෙයින් ඉවත් කොට, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:— | ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

" උපදේශකයන් සහ විශේෂ උපදේශකවරයන් පත් කිරීම.

27. මේ පනත යටතේ බැංකුවේ ව්‍යාපාර හා කටයුතු කරගෙන යාම සහ බැංකුවේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය, ගණකාධිකාරීන්, නීතිඥයන් විගණකවරුන් සහ තක්සේරුකරුවන් වැනි විශේෂ නිපුණතා හෝ වෘත්තීය සුදුසුකම් ඇති තැනැත්තන් බැංකුවේ උපදේශකයන් සහ විශේෂ උපදේශකයන් වශයෙන් මණ්ඩලය විසින් කලින් කල පත් කරනු ලැබිය හැකි අතර, එසේ පත් කරනු ලැබූ උපදේශකයන්ට සහ විශේෂ උපදේශකයන්ට මණ්ඩලය නිශ්චය කරන ආකාරයෙන් හා එසේ නිශ්චය කරන ගෙවීම් ප්‍රමාණ අනුව පාරිශ්‍රමික ගෙවිය යුතු ය. ".

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 සහ 29 වන වගන්ති මෙයින් ඉවත් කරනු ලැබේ. | ප්‍රධාන ප්‍රඥප්තියේ 28 සහ 29 වන වගන්ති ඉවත් කිරීම.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— | ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

"විෂමාචාරය හෝ හිතාමතා කැහැරදැමීම නිසා හැර සිදුවන වෙනත් සිදුවන හානි හෝ අලාභ වලින් ආරක්ෂා වීම.

30. තමන්ගේ විෂමාචාරය හෝ තමන් විසින් සිතා මතා පැහැර හැරීම හේතු කොටගෙන සිදු වී ඇති අලාභයක් හෝ හානියක් සම්බන්ධයෙන් මිස, බැංකුවේ කිසිම අධ්‍යක්ෂකවරයකු, නිලධරයකු හෝ සේවකයකු හෝ මේ පනතේ 27 වන වගන්තිය යටතේ පත් කරන ලද බැංකුවේ උපදේශකයකු හෝ විශේෂ උපදේශකයකු බැංකුවට සිදුවන යම් අලාභයක් හෝ හානියක් සම්බන්ධයෙන් වගකීමට යටත් නොවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය එහි " සෑම අධ්‍යක්ෂවරයකු, සාමාන්‍යාධිකාරිවරයකු, විගණකවරයකු, ලේකම්වරයකු, උපදේශකයකු හෝ බැංකුවේ වෙනත් නිලධරයකු හෝ සේවකයකු " යන වචන වෙනුවට " බැංකුවේ සෑම අධ්‍යක්ෂවරයකු, නිලධරයකු සහ සේවකයකු හා මේ පනතේ 27 වන වගන්තිය යටතේ පත් කරන ලද සෑම උපදේශකයකු හෝ විශේෂ උපදේශකයකු " යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය එහි වූ " සෑම අධ්‍යක්ෂවරයකු, සාමාන්‍යාධිකාරිවරයකු, විගණකවරයකු, නිලධරයකු, සේවකයකු, නියෝජිත ආයතනයක සාමාජිකයකු, ගණකාධිකාරිවරයකු හෝ බැංකුවේ ව්‍යාපාරයෙහි සේවයේ යොදවා සිටින වෙනත් යම් තැනැත්තකු " යන වචන වෙනුවට, " බැංකුවේ සෑම අධ්‍යක්ෂවරයකු, නිලධරයකු සහ සේවකයකු ද රහස්‍යතා ප්‍රකාශය අත්සන් කරන ලෙස මණ්ඩලය විසින් නියම කරනු ලැබූ, මේ පනතේ 27 වන වගන්තිය යටතේ පත් කරන ලද සෑම උපදේශකයකු හෝ විශේෂ උපදේශකයකු ද " යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය, එහි වූ " බැංකුවේ සෑම අධ්‍යක්ෂවරයකු, සාමාන්‍යාධිකාරී, විගණකවරයකු, ලේකම්, උපදේශකයකු හෝ වෙනත් නිලධරයකු හෝ සේවකයකු " යන වචන වෙනුවට, " බැංකුවේ සෑම අධ්‍යක්ෂවරයකු, නිලධරයකු සහ සේවකයකු සහ මේ පනතේ 27 වන වගන්තිය යටතේ පත් කරන ලද සෑම උපදේශකයකු සහ විශේෂ උපදේශකයකු " යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය සංශෝධනය කිරීම.

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් :—

" (1අ) විශ්‍රාම වැටුප් අරමුදල වෙනම අරමුදලක් ලෙස පිහිටුවනු ලැබිය යුතු අතර, එය ශේෂ පත්‍රයෙන් වෙන් කර තැබිය යුතු ය.

(1ආ) විශ්‍රාම වැටුප් අරමුදලේ බැඳීම් ඉටුකිරීම සඳහා ප්‍රමාණවත් මුදල් අරමුදලේ තිබීම සහතික කිරීම සඳහා, සෑම අවුරුදු දෙකකට වරක් විශ්‍රාම වැටුප් අරමුදලේ ජීවගණක තක්සේරුවක් කළ යුතු ය. " ; තවද

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි " නිශ්චල දේපළ ඇපයක් " යන වචන වෙනුවට " චංචල හෝ නිශ්චල දේපළ ඇපයක් " යන වචන ආදේශ කිරීමෙන්.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය, එහි (1) වන උප වගන්තියේ " අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන " යන වචන වෙනුවට " මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන " යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය මෙයින් ඉවත් කොට, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

" බැංකුවේ ගිණුම් විගණනය

37 (1) බැංකුවේ, එක් එක් මුදල් වර්ෂය සඳහා වූ ගිණුම්, ඒ ඒ මුදල් වර්ෂය අවසාන වී මාස තුනක් ඇතුළත, විගණකාධිපතිවරයා වෙත, විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

(2) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, බැංකුවේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.".

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 39 සහ 40 වන වගන්ති, මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 39 සහ 40 වන වගන්ති ඉවත් කිරීම.

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

" ගිණුම් අදාළ පොලිය.

41. බැංකුවේ තැන්පත් කරන ලද මුදල් සඳහා, මණ්ඩලය නිශ්චය කරන අනුපාතික මත බැංකුව විසින් පොලිය ගෙවිය යුතු ය. එසේ වුවද හිමිකම් නොපෑ තැන්පතු සංචිතයට මාරු කළ මුදල් සඳහා කිසි පොලියක් නොගෙවිය යුතු ය.".

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය ඉවත් කිරීම.

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය, එහි (5), (6), (7), (8), (9) සහ (10) වන උපවගන්ති ඉවත් කර ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (5) බැංකුව විසින් යම්කිසි නාමිකයකුට කිසියම් ගෙවීමක් කිරීම ඒ නාමිකයා විසින්, ඔහුගේ අනන්‍යතාව සම්බන්ධයෙන් බැංකුවට පිළිගත හැකි සාක්ෂි මගින් සනාථ කළ ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කළ හොත් මිස, නොකළ යුතු ය.

(6) මියගිය නාමයෝජකයාගේ නාමිකයකට කරන ගෙවීමක්, ඒ නාමයෝජකගේ බැරට තිබෙන මුදල් සම්බන්ධයෙන් බැංකුවේ බැඳීම් සම්පූර්ණයෙන් ඉටු කිරීමක් වන්නේ ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම.

29. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය එහි වූ “ඔහුගේ බැරට ඇති මුදල්, සුදුසු යයි බැංකුව කල්පනා කරන ආකාරයට ඒ වෙනත් තැනැත්තාට, අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව ගෙවිය යුතුය.” යන වචන වෙනුවට, “ඔහුගේ බැරට ඇති මුදල් සුදුසු යයි මණ්ඩලය කල්පනා කරන ආකාරයට, ඒ වෙනත් තැනැත්තාට, මණ්ඩලයේ අනුමැතිය ඇතිව ගෙවිය යුතුය.” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

30. 1982 අංක 8 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

“ හිමිකම් නොපෑ තැන්පතු සංචිතය.

47. (1) ගිණුමක් අක්‍රියව පැවති ඇති විට, එනම්—

(අ) ඉතිරි කිරීමේ ගිණුමක් සම්බන්ධයෙන් වන විට එය වයස අවුරුදු දහසයට එළඹීමේ දී හෝ ඉන් පසුව ආරම්භ කරන ලද ගිණුමක් නම්, ඒ ගිණුම ආරම්භ කළ තැනැත්තා විසින්, මුදල් ආපසු ගැනීම සඳහා හෝ ගිණුමෙහි මුදල් තැන්පත් කිරීම සඳහා හෝ පොලිය ඇතුළත් කිරීම සඳහා හෝ එම ඉතිරි කිරීමේ පොත අවුරුදු දහයක කාල සීමාවක් ඇතුළත බැංකුව වෙත ඉදිරිපත් කර නොමැති විට, හෝ වයස අවුරුදු දහසයට එළඹීමට පෙර ගිණුම ආරම්භ කළ තැනැත්තකු සම්බන්ධයෙන් නම් වයස අවුරුදු දහසයට එළඹී විට හෝ ඉන්පසු අවුරුදු දහයක කාල සීමාවක් ඇතුළත, මුදල් ආපසු ගැනීම සඳහා හෝ ගිණුමෙහි මුදල් තැන්පත් කිරීම සඳහා හෝ පොලිය ඇතුළත් කිරීම සඳහා හෝ එම ඉතිරි කිරීමේ පොත බැංකුව වෙත ඉදිරිපත් කර නොමැති විට ;

(ආ) තැන්පතු ගිණුමක් සම්බන්ධයෙන් වන විට එය වයස අවුරුදු දහසයකට එළඹීමේ දී හෝ ඉන් පසුව ආරම්භ කළ ගිණුමක් නම්, ඒ ගිණුම ආරම්භ කළ තැනැත්තා විසින් එය කල්පිරීමේදී නිරායාසයෙන් අලුත් කිරීම සඳහා බැංකුවට උපදෙස් දී නොමැතිව සහ තැන්පතු ලදුපත අවුරුදු දහයක කාලසීමාවක් තුළ අලුත් කිරීම සඳහා ඉදිරිපත් කර නොමැති විට, හෝ වයස අවුරුදු දහසයට එළඹීමට පෙර ගිණුම ආරම්භ කළ තැනැත්තකු සම්බන්ධයෙන් නම්, වයස අවුරුදු දහස

සට එළඹීමෙන් පසු අවුරුදු දහයක කාල සීමාවක් ඇතුළත ගිණුම් කල්පිරීමේ දී නිරායාසයෙන් අලුත් කිරීම සඳහා බැංකුවට උපදෙස් දී නොමැතිව සහ තැන්පතු ලදුපත අලුත් කිරීම සඳහා ඉදිරිපත් කර නොමැති වීට

ඒ ගිණුමේ බැරට තිබෙන මුදල්, "හිමිකම් නොපෑ තැන්පතු සංචිතය" යනුවෙන් හැඳින්වෙන විශේෂ සංචිතයකට මාරු කළ යුතු ය.

(2) හිමිකම් නොපෑ තැන්පතු සංචිතයට මුදල් මාරු කරන ලද්දේ යම් ගිණුමකින් ද, මුදල් එසේ මාරු කරනු ලැබූ දින සිට එම ගිණුම තවදුරටත් බැංකුවේ බැඳීමක් ලෙස නොසැලකිය යුතු ය.

(3) හිමිකම් නොපෑ තැන්පතු සංචිතයේ බැරට තිබෙන සම්පූර්ණ මුදල හෝ අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි එහි යම් කොටසක්, ප්‍රාග්ධනගතකර එසේ ප්‍රාග්ධනගත කරනු ලැබූ මුදල් ප්‍රමාණයේ වටිනාකමට කොටස් බැංකුව විසින් භාණ්ඩාගාරයේ ලේකම්වරයාට නිකුත් කළ හැකි ය.

(4) (1) වන උපවගන්තියේ සඳහන් ගිණුමක බැරට තිබුණු මුදල් සඳහා, යම් මුදලක් හිමිකම් නොපෑ තැන්පතු සංචිතයට මාරු කිරීමෙන් පසුව බැංකුව වෙත හිමිකම් පෑමක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක බැංකුව විසින් එම හිමිකම් පෑම පරීක්ෂා කර බැලීමෙන් පසුව, එම ගිණුමේ තිබුණු මුදල් ප්‍රමාණයට සමාන මුදලක් හිමිකම් පාන්නාට ගෙවා, එසේ ගෙවන ලද මුදල් ප්‍රතිපූරණය කරන ලෙස භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය. එම ඉල්ලීම ලැබුණු පසු ඉල්ලුම්කර ඇති මුදල භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින්, හැකිතාක් ඉක්මණින් ඒකාබද්ධ අරමුදලෙන් බැංකුවට ගෙවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය සංශෝධනය කිරීම.

31. ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ, (අ) ඡේදයේ " නිශ්චල දේපළ උකසක් ; හෝ " යන වචන වෙනුවට "චංචල හෝ නිශ්චල දේපළ උකසක් හෝ ඇපකරයක් පදනම මත ; හෝ " යන වචන ආදේශ කිරීමෙන්, සහ

(2) ඒ වගන්තියේ, (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ "බැංකුව වෙත උකස් කරන ලද යම් නිශ්චල දේපළක්" යන වචන වෙනුවට "බැංකුව වෙත උකස් කරන ලද යම් චංචල හෝ නිශ්චල දේපළක්" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තිය සංශෝධනය කිරීම.

32. ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ වූ "සැලකිය යුතු සම්බන්ධතාවක් ඇත්තා වූ" යන වචන වෙනුවට "ප්‍රමාණවත් නිශ්චල දේපලක් උකස් කිරීම මත නිවාසයක් මිල දී ගැනීමේ හෝ ඉදිකිරීමේ කාර්ය සඳහා හැර, සැලකිය යුතු සම්බන්ධතාවක් ඇත්තා වූ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම.

33. ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය, එහි "යම් නිශ්චල දේපළ උකසක් මත" යන වචන වෙනුවට "යම් චංචල හෝ නිශ්චල දේපළ උකසක් මත" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 52 සිට 74 තෙක් වූ වගන්ති ඉවත් කිරීම.

34. ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තිය හැර 52 සිට 74 තෙක් වූ වගන්ති (ඒ වගන්ති දෙකම ඇතුළුව) මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 77 වන වගන්තිය සංශෝධනය කිරීම.

35. ප්‍රධාන ප්‍රඥප්තියේ 77 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති ඉවත් කොට, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(2) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු බැංකුවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම සහිතව ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු බැංකුවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලබන අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 10 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය සංශෝධනය කිරීම.

36. ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය එහි වූ "ණය සහතාදායක ආඥාපනතේ ඇතුළත් කිසිවක්" යන වචන වෙනුවට "ණය සහතාදායක ආඥාපනතේ හෝ 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනතේ ඇතුළත් කිසිවක්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තිය ඉවත් කිරීම.

37. ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තිය ඉවත් කිරීම.

38. ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තිය සංශෝධනය කිරීම.**

39. ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි (2) වන උපවගන්තියේ (ඇ) සහ (ඉ) ඡේද ඉවත් කොට, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් :—

"(ඇ) තැන්පතු සහ ඉතිරි කිරීමේ ගිණුම් ඇති තැනැත්තන් විසින් පාස් පොත් හෝ වෙනත් ඒ සමාන යම් ලේඛන පාවිච්චි කිරීම ;

(ඉ) ගිණුම් ඇති තැනැත්තන් විසින් ගිණුම් වර්ගය, තැන්පත්කරුවන් අයත් පන්තිය, එක් වරකට ලබාගත හැකි උපරිම මුදල සහ මුදල් ලබාගත හැක්කේ කොපමණ කාලයකට වරක් ද යන කරුණු සම්බන්ධ පරිසීමා ඇතුළුව, මුදල් මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පරිසීමාවලට සහ අනුසීමාවලට යටත්ව, චෙක්පත් නිකුත් කිරීම සඳහා පහසුකම් ;" සහ

(2) එහි (2) වන උපවගන්තියේ (ඌ), (එ), (ඒ), (ඔ), (ඕ), (ක), (ග), (ච), (ඡ), (ට), (ඩ), (ණ), (ත), (ද), (න), (ප), (බ), (ම), (ය) සහ (අඅ) යන ඡේද ඉවත් කිරීමෙන්.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තිය සංශෝධනය කිරීම.**

40. ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) පිළිවෙලින්, "අනුමත කළ ඉතිරිකිරීමේ කණ්ඩායම" "ලොතරැයිය", "තක්සේරුකාරවරයන්ගේ මූල මණ්ඩලය". සහ "තෑගි තරඟය" යන යෙදුම්වල අර්ථ කථන ඉවත් කිරීමෙන් ;

(2) "වාණිජ බැංකුව" යන්නෙහි අර්ථකථනය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් ;

'"වාණිජ බැංකුව" යන්නෙන්, බැංකු ව්‍යාපාරය කර ගෙන යන්නා වූ ද, 1988 අංක 30 දරන බැංකු පනතේ විධිවිධාන යටතේ, බලපත්‍රලාභී වාණිජ බැංකුවක් ලෙස බලපත්‍ර ලබා ඇත්තා වූ ද සමාගමක් අදහස් වේ ;'

(3) "අධ්‍යක්ෂවරයා" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

'"මුදල් අනුග්‍රහය" යන්නෙන් බැංකුව ගනුදෙනුකරුවකු වෙනුවෙන් ඇප සහතිකයක් දී හෝ අන්‍යාකාරයෙන් බැඳීමක් ඇති කරගෙන ඇති අවස්ථාවක ඒ ගනුදෙනුකරු වෙනුවෙන් බැංකුව විසින් කෙළින්ම හෝ අනියම් ලෙස ප්‍රදානය කරන ලද අත්තිකාරමක් අදහස් වේ ;'

(4) "නියම කිරීම" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

'"පළාත් සභාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII අ පරිච්ඡේදය යටතේ පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ;'.

(5) "පළාත් පාලන ආයතනය" යන යෙදුමෙහි අර්ථකථනය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

'"පළාත් පාලන ආයතනය" යන්නෙන්, මහ නගර සභාවක්, නගර සභාවක්, සහ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම් නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇති කරන ලද හෝ පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ;'.

(6) "ගැනුම්කරු" යන වචනයේ අර්ථකථනය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

'"ගැනුම්කරු" යන්න ඉතිරිකිරීමේ සහතිකයක් හා සම්බන්ධව යෙදෙන විට, එයින් මේ පනත යටතේ ඉතිරිකිරීමේ සහතිකයක් නිකුත් කරනු ලබන තැනැත්තා හෝ පුද්ගල මණ්ඩලය අදහස් වේ.'.

නොගැළපීමක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

41. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

සැක දුරු කිරීම.

42. ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය යටතේ කරන ලද කවර හෝ යෝජනා සම්මතයක්, ඒ වගන්තිය ඉවත් කරනු ලැබීම ද ඒ නොතකා, සියලු කාර්ය සඳහා වලංගු හා බලසහිත බවත්, ඒ අනුව ඒ යෝජනා සම්මතය ප්‍රකාර කරන ලද සියලු ක්‍රියා, ඒ වගන්තිය ඉවත් කිරීමක් සිදු නොවූවා මෙන් තවදුරටත් කරගෙන ගොස් සම්පූර්ණ කළ හැකි බවත් සැක දුරුකිරීම පිණිස මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 570 කි, (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01. රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.